


**නාට්‍යයක්** නැරඹීමෙන් ළමයා ලබන වින්දනය ඔස්සේ ඔහුට දිය හැකි දෑ අසීමිතය. ළමයකුට අවබෝධ කරලීමට අවශ්‍ය කරුණා ඔහු ඉදිරියේ මවාපාන සිදුවීම හා චරිත මගින් ඔහු වෙත ගෙනයාමේදී එය ප්‍රබල ලෙස ඔහු සිතෙහි කාවදිනු ඇත. ශතවර්ෂ ගණනක් මිනිසා රැස්කර ගත් ඥාණය ළමයා වෙහෙසට පත් නොකර ඔහු වෙත ගෙන යා හැකි ප්‍රබල මාධ්‍යයක් ලෙස ළමා නාට්‍ය භාවිතා කළ හැකිය.
සංස්කෘතික වශයෙන් ව්‍යාකූලත්වයට පත්ව සිටින වත්මන් බාලපරපුරට සංස්කෘතික හා සමාජ හරයන් ගෙනයාමටත්, අප කලාශිල්ප හා සාහිත්‍ය පිළිබඳ දැනුමක් ගරුත්වයක් ඇතිකරලීමටත් නාට්‍ය මාධ්‍ය ඉතා ප්‍රබල ආයුධයක් කරගත හැක. දේශීය භාෂාවන් සාහිත්‍ය, සංගීතය, නැටුම් ආදිය පිළිබඳව බාල පරපුරට අවබෝධකරවීමට ඉතා පහස මාධ්‍යයක් ද වනු ඇත.

## ළමයින් සඳහා ප්‍රවීණයන් විසින් රඟපාන නාට්‍ය

නාට්‍ය කලාවේ යම් යම් සිද්ධාන්ත හදාරා ඇති ප්‍රවීණ රචකයකු, අධ්‍යක්ෂක වරයෙකුගේ මූලිකත්වය ඇතිව ප්‍රවීණ නළු නිළි පිරිසක් යොදාගෙන නිර්මාණය කරන්නාවූ නාට්‍ය ළමුන් උදෙසා ප්‍රවීණයන් විසින් නිර්මාණය කරණ නාට්‍ය වෙයි. ළමා නාට්‍ය නිර්මාපකයෙක් නාට්‍ය කලාවේ සිද්ධාන්ත කෙතරම් හදාරා ඇතිද ඒ හා සමානවම ළමා මනස පිළිබඳවද අවබෝධයක් ඇත්තකු විය යුතුය.
පරාජය, අභිමිවීම වැනි ලෝක ධර්මතාවයන් ළමයා වෙත ඉදිරිපත් කල යුතුයි. යුද්ධයේ කුරිරු බව ළමයා වෙත විදහාලිය යුතුයි, ආදි වශයෙන් සිතන ඇතැම් ළමා නාට්‍ය නිර්මාපකයන්ද අපට හමුවී ඇත. ඒ සිතුවිලිවලට වරදක් කිව නොහැක. එය කෙසේ ක්‍රියාත්මක කරන්නේද යන්න ඉතාමත් වඩ වඩාත් අවධානය යොමුකල මනාය.

බේදජනක කතා වස්තුවක්, අවස්ථාවක් ළමයා වෙත ගෙන යාමේදී ඔහුගේ දරා ගැනීමේ ශක්තිය ගැන සලකා ඔහුට එවැනි දෑ ඉදිරිපත් කළ යුතුය. ළමා නාට්‍ය රචකයා ළමා මනසට ගෝචරවන කතා පුවතක් භාෂාවක් චරිතයක් භාවිතා කිරීමට ප්‍රයත්න දරන්නාසේම අධ්‍යක්ෂකද ළමා මනසට සමීප විය හැකි අයුරේ දෘෂ්‍ය කාව්‍යයක් මැවීමට සමත් විය යුතු වන්නේය.

ළමයා වෙනුවෙන් මෙසේ නිර්මාණය කරනු ලබන නාට්‍යයන් හි සාර්ථකත්වය රඳා පවතිනුයේ රංග භූමියේ දිග හැරෙන අවස්ථා හා චරිත සමඟ ළමයාගේ ඇති වන සම්බන්ධය තුළින් තමුන්ගේ යම් යම් ක්‍රියාකලාපයන් ගැන හේතුඵල අවබෝධයක් ලබා ගැනීම මතය. ළමයා වූ කලී අපූර්ව වූ ප්‍රේක්ෂකයෙකි. ඔවුනගේ වයස් තලයනට උචිත වූ නාට්‍යයකින් ඔවුන් ලබන වින්දනයත් ඒ හා ඔවුන් බද්ධ වන ආකාරයත් ඇතැම් විට වැඩිහිටි අප මවිත කරවනසුළුය.

1996 වසරේ රාජ්‍ය ළමා නාට්‍ය උළෙලේ ප්‍රවීණයන් විසින් ළමුන් වෙත රඟන නාට්‍ය අංශයේ හොඳම නාට්‍ය, පිටපත, අධ්‍යක්ෂණය, නළුවා ආදී සම්මාන ගණනාවකින් පිදුම් ලද




මවිසින් (කුසුම්සිරි) නිර්මාණය කළ ''ඔක්කෝමල්ල කොල්ලකාලා'' ළමා නාට්‍යයේ දර්ශණවාර කිහිපයකදී සිදුවූ සිදුවීම් කිපයක් නිදසුන් කොට ගනිමු.

එම නාට්‍යය වු කලී සිංහල ජන සාහිත්‍යයේ එන ජන කතාවක් ඇසුරින් නිර්මිත කතා පුවතකින් ද, ජන සංගීත සහ ජන නැටුම් ආභාෂයෙන් නිර්මිත සංගීතය සහ නර්තනයෙන්ද පෝෂණය වුවක් විය. විනාඩි (50) පනහක කාලයක් රඟ දැක්වූ නාටකය අවසානයේ නාට්‍යයේ

*බේදජනක කතා වස්තුවක්, අවස්ථාවක් ළමයා වෙත ගෙන යාමේදී ඔහුගේ දරා ගැනීමේ ශක්තිය ගැන සලකා ඔහුට එවැනි දෑ ඉදිරිපත් කළ යුතුය.*

වු ගීත බණ්ඩ මුමුණන ළමුන් අපට හමුවිය. අපේ ජන සංගීතයේ නාදරටාවන් ඒ තුළින් ඔවුනට සමීපකරලීමට අපට හැකිවිය. කතා පුවතේ වූ යම් යම් ගුණාංගයන් ඔවුන්ගේ නැවත මෙනෙහි කිරීමේ පථයට පතිත වී තිබිණ.

කපටි කයිරාටික මිනිසුන්ගේ ක්‍රියාවන් කෙරෙහි බුද්ධිමය දෘෂ්ඨියක් නාට්‍යයේ චරිත සහ අවස්ථා සමඟ ළමුන් බද්ධ වු ආකාරය කියාපෑමට තවත් නිදසුනකි. රාජ්‍ය ළමා නාට්‍ය උළෙලේ එක් දර්ශනයකි. ජෝන් ද සිල්වා සමරු රඟහල අසුන් හිස්වනතුරු පිරී ගියේය. ළමුන් රැගෙන ආ දෙමාපියන්ද ළමුන් ප්‍රමාණයටම සමවිය. රඟහල නිර්මාණය කර ඇති ආකාරය අනුව ශාලාවේ ප්‍රේක්ෂකාගාරයත් වේදිකාවත් අතර තරමක විශාල පරතරයකි. නාට්‍යය ආරම්භයේ සියල්ලන්ම අසුන්ගෙන සිටිනු පෙනින. නාට්‍ය රඟදැක්වෙන අතරතුරේ දී ළමුන් එකිනෙකා සෙමෙන් සෙමෙන් ඉදිරියට ඇදෙනුද යන්තමින් පෙනින. විනාඩි 50ක කාලයක් නාට්‍ය රඟදක්වා අවසන් වන මොහොතේ අප සියල්ලන්ම මවිත කරවනව සුළුත්, සතුට දනවන සුළුත් දසුනකි. වේදිකාවත් ප්‍රේක්ෂකාගාරයත් අතර පරතරයේ පිරී ඉතිරී ගිය ළමා ප්‍රේක්ෂකයන්ගේ දසුනකි. ඇතමුන් සිටගෙන, බිම හිඳගෙන සිටිනු පෙනෙනු ඇත. ඔවුන් වැඩිහිටියන්ග් සමීපයෙන්, මදක් ඉදිරියට ඇදී ඒමට තරම් අවස්ථා හා චරිත සමඟ බැඳී සිටියෙමු.




තවත් දිනෙක විහාරමහාදේවී එළිමහන් රංග පීඨයේ දර්ශණයකි. නාට්‍යයේ කතා පුවතට අනුව එක් පෙට්ටගමක් තුළ අයෙකු සැඟවී සිටියි. ඒ නිවස තුළ සිටින අනෙක් චරිතයන්ට ඔහුව නොපෙනෙනු ඇත. සැඟවී සිටින චරිතය අනාවරණය විය යුත්තේ නාට්‍යය අවසානයේදීය. ඊට කලින් අනාවරණය වුවහොත් කතා පුවත ගලා යා නොහැක. නාට්‍යයෙන් තුනෙන් දෙකක් පමණ රඟදැක්වී හමාරය. කතාපුවතට අනුකූලව වේදිකාවේ සිටින අනෙක් චරිත සැඟවී සිටින්නා සොයනු ඇත. එහෙත් සොයාගත නොහැකි වන්නේය. ඔවුනට සොයාගත හැකිවිය යුත්තේ නාට්‍ය අවසානයේය. අප සියල්ලන් මවිත කරවමින් කිසිවකු නොසිතූ ලෙස ප්‍රේක්ෂකාගාරයේ වූ ළමයෙක් වේදිකාවේ කොණක දිස්වන්නේය. ක්ෂණයෙන් ඔහු පෙට්ටගම අසලට පැමිණියේය. පෙට්ටගමේ පියන මහ හඬින් කියා පෑවේය. නළු නිළියන් සියල්ල සිරවී ගියේය. කතාව ගලායාමට නොහැක. චරිතය අනාවරණය වී හමාරය. කතා පුවතේ විනාඩි දහයක පමණ කාලයකට පසුව සිදුවිය යුත්ත ක්ෂණයෙන් සිදුවිය. ප්‍රවීණ නළු නිළියන්ගේ දක්ෂතාවයන් හේතුවෙන් ක්ෂණික රැගුම් කීපයක් ඉදිරිපත් විණ. නාට්‍යයේ විශාල කොටසක් මඟහැර චරිතය අනාවරණය වුවායින් පසු සිදුවීම් පෙළට ප්‍රවිශ්ඨවීමට අපට සිදුවිය. මේ අයුරේ නිදසුන් කොතෙකුත් පෙන්වා දිය හැක්කේය. ළමා ප්‍රේක්ෂකයන් නාට්‍යයන් සමඟ බද්ධ වන අයුරුත් වින්දනය ලබන අයුරත් අපූර්ව ජනකය.
සෞන්දර්ය විෂයන් හැදෑරීම තුළින්, සෞන්දර්ය විෂයක නියැලීම තුළින් ළමා මනසෙහි පමණක් නොව වැඩිහිටි මනසක පවා මෘදු මොලොක් බව, සානුකම්පිත බව වර්ධනය වනු ඇත. ලෝකය මානුෂිකත්වය කෙරෙහි නිසි අවබෝධයක්, මෘදු බැල්මක් හෙළීමට හුරු පුරුදු වනු ඇත.
විදේශීය රටවල වෙසෙන ශ්‍රී ලාංකික ජන සමාජයනට අයත් අප බාල පරපුර තම අනන්‍යතාවයන් ගැන තරමක ව්‍යාකූලත්වය පසුවෙතැයි කීම නිවැරදිය. විශේෂයෙන් මෙවැනි පරපුරකට සෞන්දර්ය විෂයන් හරහා කළ හැකි මෙහෙය අතිශය වැදගත් වන්නකි. ඉදින් මෙල්බන්පුර වෙසෙන නාට්‍ය කලාවෙහි පළපුරුදු ඇති වැඩිහිටි සැමගේ අවධානය, දායකත්වය ළමා නාට්‍ය කරණය කෙරෙහි යොමුවීමටත් ඒ තුළින් අප බාලපරපුරට මෙහෙයක් සිදුවීමටත් මේ ලිපි පෙළ සුළු හෝ උපකාරයක් වේවායි පතමු.

ඉදිරි කලාපයෙන් ළමා නාට්‍යයෙහි තවත් වර්ගීකරණයන් කීපයක් විචාරණය කරලීමට අපේක්ෂිතය.

නොවැළැක්විය හැකි හේතු මත ලක්ස්මන් කොඩිතුවක්කු ලියන ''කුට්ටම් පොකුණ'' මෙවර පළ නොවන බව කරුණාවෙන් සලකන්න.

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය

ලක් හඬ FM 97

සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා

ඔබේ හඬ - ලක් හඬ

MARIA MONTESSORI
PRE - SCHOOL &
EARLY LEARNING CENTRE

Excellent age appropriate program for children from 6 months to kinder age

Qualified & experienced staff

A duel teaching approach of Montessori & play based methods

Excellent Care

Taking Enrolments now

Ph 9465 3992
42 Main Street
Thomastown 3074